# <u>මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නව හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 01</u>

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතු |
|---|---|---|---|---|
| 6.2.3.1.1 | **අ.පො.ස. (උ.පෙළ.) ප්‍රතිඵල මත බඳවා ගැනීම**<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ ගණිතය / කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියළුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර) එකවර සමත් වීම. පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත් වීම.<br><br>සහ<br><br>සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදි විෂයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම. | 6.2.3.1.1 | **අ.පො.ස. (උ.පෙළ.) ප්‍රතිඵල මත බඳවා ගැනීම**<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ ) විභාගයේදී ජෛවීය විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයන් අතුරින් විෂයන් 03 ක් හදාරා සියළුම විෂයන්ගෙන් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරික්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)<br><br>හෝ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ ) විභාගයේදී භෞතිය විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයන් අතුරින් විෂයන් 03 ක් හදාරා සියළුම විෂයන්ගෙන් එකවර සමත්වීම (සාමාන්‍ය පොදු පරික්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)<br><br>සහ<br><br>සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන් 04 ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1966/23 හා 2016 මැයි මස 11 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය. |
| 6.2.3.4 | වයස:<br><br>අවම සීමාව - අවුරුදු 18<br>උපරිම වයස - අවුරුදු 28<br><br>මෙම සේවා ව්‍යවස්ථාවේ 6.2.4.3. ඡේදය යටතේ විද්‍යාවේදී (හෙද) උපාධිය මත බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 35 වේ.) | 6.2.3.4 | වයස:<br><br>අවම සීමාව - අවුරුදු 18<br>උපරිම සීමාව - අවුරුදු 28<br><br>මෙම සේවා ව්‍යවස්ථාවේ 6.2.4.3. ඡේදය යටතේ විද්‍යාවේදී (හෙද) උපාධිය මත බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 35 වේ.) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1881/14 හා 2014 සැප්තැම්බර් මස 23 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය. |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-07-03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | | |
|---|---|---|---|---|
| 6.2.4.1 | **එක් වර්ෂයක අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බදවා ගැනීම.**<br><br>මෙහිදී බදවා ගන්නා සංඛ්‍යාව සලකා බලන වර්ෂයේ ජීව, ගණිත හා කෘෂි විද්‍යා විෂය ධාරාවන්ගෙන් අයදුම් කරන සිසුන් සංඛ්‍යාවට සමානුපාතිකව , බෙදා ඉන් අනතුරුව එම එක් එක් විෂය ධාරාවෙන් ඉහළම Z අගය ලබන්නා අයදුම්කරුවන් අතුරින් දිස්ත්‍රික් පදනම මත සුදුස්සන් තෝරා ගනු ලැබේ . | 6.2.4.1 | **එක් වර්ෂයක අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බදවා ගැනීම.**<br><br>මෙහිදී දිවයිනෙන් බදවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බදවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.<br><br>ඉන් පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බදවා ගත යුතු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයේ ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හා භෞතිය විද්‍යා විෂය ධාරාව යටතේ අයදුම්කර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බදවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.<br><br>එලෙස එක් එක් විෂය ධාරාව යටතේ බදවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% පිරිමි අයදුම්කරුවන්ගෙන්ද, 95% ගැහැණු අයදුම්කරුවන්ගෙන්ද සමන්විත වන ලෙස දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය සහිත අයදුම්කරුවන් අතරින් පුහුණුවට බදවා ගත යුතු සංඛ්‍යාව තෝරා ගනු ලැබේ. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1966/23 හා 2016 මැයි මස 11 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය. |
| 6.2.4.2 | **වර්ෂ දෙකක් (02) හෝ ඊට වැඩි වර්ෂ ගණනක අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බදවා ගැනීම.**<br><br>මෙහිදී බදවා ගන්නා සංඛ්‍යාව එක් එක් වර්ෂයෙන් අයදුම්කරන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදනු ලැබේ. අනතුරුව එම එක් එක් වර්ෂය සඳහා බදවා ගැනීමට නියමිත ප්‍රමාණය එම වර්ෂයේ අදාළ ජීව, ගණිත හා කෘෂි විද්‍යා විෂය ධාරාවන්ගෙන් අයදුම් කරන සිසුන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා ඉන් අනතුරුව ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් දිස්ත්‍රික් පදනම මත සුදුස්සන් තෝරා ගනු ලැබේ. | 6.2.4.2 | **වර්ෂ දෙකක් (02) හෝ ඊට වැඩි වර්ෂ ගණනක අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බදවා ගැනීම.**<br><br>මෙහිදී දිවයිනෙන් බදවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බදවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.<br><br>ඉන් පසුව එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බදවා ගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම් කර සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බදවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1966/23 හා 2016 මැයි මස 11 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය. |



ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-07-03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉන් පසු එම එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජෛවීය විද්‍යා විෂය ධාරාව හා භෞතිය විද්‍යා විෂය ධාරාව යටතේ අයදුම්කර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂවලට අදාළව එක් එක් විෂය ධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.<br><br>එලෙස එක් එක් වර්ෂයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% පිරිමි අයදුම්කරුවන්ගෙන්ද, 95% ගැහැණු අයදුම්කරුවන්ගෙන්ද සමන්විත වන ලෙස එක් එක් වර්ෂයන්හි එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් පුහුණුවට බඳවා ගනු ලැබේ. | |

2017.05.02 දිනැති කොමිෂන් සභාවේ නිර්දේශය

| නම | | | අත්සන |
|---|---|---|---|
| 01. | ගාමිණී දසනායක මහතා | (සභාපති) | |
| 02. | යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | |
| 03. | ජී.ජී.එස්.ඒ. දිසානායක මහත්මිය | (සාමාජික) | |
| 04. | වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | |
| 05. | ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | |

**මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය**

අනුමත කරමි / ~~නොකරමි~~

..................................
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 17.07.03